මම ආඉෂා තුමියගෙන්, "උපාවාසය නැවත ඉටු කරන නමුත් සලාතය නැවත ඉටු නො කරන ඔසප් තත්ත්වයේ පසුවන කාන්තාවගේ තත්ත්වය කුමක් ද?

මුආදා තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: මම ආඉෂා තුමියගෙන්, "උපාවාසය නැවත ඉටු කරන නමුත් සලාතය නැවත ඉටු නො කරන ඔසප් තත්ත්වයේ පසුවන කාන්තාවගේ තත්ත්වය කුමක් ද?"
යැයි විමසා සිටියෙමි. එවිට ඇය, "ඔබ හරූරිය්යාවාදියෙකු දැ? "යි විමසා සිටියාය. මම: හරූරිය්යා වාදියෙකු නොවෙමි. නමුත් මම මෙසේ අසා සිටිමි" යැයි පැවසුවෙමි. ඇය: "අපට මේවා සිදු වී ඇත. එවිට උපවාසය නැවත ඉටු කිරීමට අපට නියෝග ලැබුණු නමුත් සලාතය නැවත ඉටු කිරීමට නියෝග නොලැබුවෙමු." යැයි පැවසීය. [صحيح] [متفق عليه]

මුඃමින්වරුන්ගේ මෑණියන් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් "උපාවාසය නැවත ඉටු කරන නමුත් සලාතය නැවත ඉටු නොකරන ඔසප් තත්ත්වයේ පසුවන කාන්තාවගේ තත්ත්වය කුමක් ද?" යැයි මුආදා අල්-අද්විය්යා තුමිය විමසා සිටියාය. එවිට එතුමිය ඇයට මෙසේ පවසා සිටියාය ය: "ඔබ මුරණ්ඩුකමින් හා දැඩි බවින් අධික ලෙස ප්රශ්න කර සිටින ඉස්ලාමයෙන් බැහැර වූ හරූරිය්යාවාදීන් අතරින් කෙනෙක් දැ?"යි විමසා සිටියා ය. "මම හරූරිය්යා වාදියෙකු නොවෙමි. නමුත් මම මෙසේ විමසා සිටිමි." එතුමිය මෙසේ ප්රකාශ කළා ය. "අපි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග සිටියෙමු. එවිට උපවාසය නැවත ඉටු කිරීමට නියෝග ලැබුවෙමු. නමුත් සලාතය ඉටු කිරීමට නියෝග නොලැබුවෙමු."

http://sunnah.global/hadeeth/si/show/3449